# Analysis of *Theravāda Antarābhava*

ථෙරවාද අන්තරාභව විග්‍රහය

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

පසුකාලීන ථෙරවාද අටුවා විවරණයන් තුළින් සංවර්ධනය වී නිකායාන්තර බුදුසමයේ ද දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජනය වූ සංකල්පයක් ලෙස අන්තරාභවිකත්‍වය පිළිබඳ අදහස දැක්වේ. මේ පිළිබඳ ආකල්ප ආදි බුදුසමයේ මෙන්ම ප්‍රාග් බෞද්ධ යුගයේ ද දක්නට ඇත. විශේෂයෙන් වේද උපනිශද් ග්‍රන්ථයන් තුළ මේ පිළිබඳ විශේෂ වශයෙන් සාකච්ඡා වී ඇත.[1] බෞද්ධ දර්ශනයේ උදාවත් සමඟ මෙය තවදුරටත් සංවර්ධනය වී එය ථෙරවාද ආදි වූ බෞද්ධ ගුරුකුලවල ප්‍රචලිත විය. එසේම එහි ආභාසය තන්ත්‍රයානයට අයත් බෞද්ධ ඉගැන්වීම් තුළට ද ඇතුළත් වී ඇති බව ටිබෙට් මළ පොත හෙවත් තන්ත්‍රයානික සිද්ධාන්තයන් අධ්‍යයනය කිරීමේ දී පෙනී යයි. මෙසේ වේද වෛදික යුගයෙන් ආරම්භව බෞද්ධ දර්ශනයෙන් සංවර්ධනය වූ අන්තරාභවිකත්‍වය පිළිබඳ අදහස වර්තමාන බෞද්ධ විද්වතුන්ගේ ද නොයෙකුත් මතභේදාත්මක විවරණයන්ට ලක් වූ සංකල්පයක් ලෙස සැළකිය හැකිය.

"අන්තරාභවිකත්‍වය" යනු කුමක්දැයි විමසීමේ දී මෙසේ විග්‍රහයට ලක්වන්නේ මරණයත් උපතත් අතර වූ අවස්ථාවක් පිළිබඳව ය. එනම් චුතියක් ප්‍රතිසන්ධියක් අතර වූ යම් අවස්ථාවක් වේද? යන්නයි. උක්ත කාරණාව පිළිබඳ ථෙරවාදී ආකල්පය විමසීමේ දී ථෙරවාදය අන්තරාභවිකත්‍වය සම්පූර්ණ වශයෙන් ප්‍රතික්ෂේප කරන අයුරු දැකගත හැකි වේ.

ථෙරවාද සම්ප්‍රදායානුගතව මරණය හා නැවත භවගාමීත්‍වය හෙවත් චුතිය හා ප්‍රතිසන්ධිය සිදුවන්නේ එකම චිත්ත වීථියක් තුළ ය. එය අතර බිඳීයාමක් ථෙරවාදය තුළ අවධාරණය වන්නේ නැත.[2] මෙය කුඩැල්ලෙකුගේ ගමන් විලාසය ද, වඳුරෙකු අතු පතර යාම ද[3] උපමා කොට පෙන්වා දී ඇත. මේ

---

[1] යථාදර්ශෙ තථාත්මනි - යථා ස්වප්නෙ තථා පිතෘලොකෙ
යථාප්සු පරිවාදර්ශෙ තථා ගන්ධර්වලොකෙ - ඡායාතපයොර්වා බ්‍රහ්මලොකෙ

Kathaupanisad. 3-5-9, The Principal upanisads, S. Radhakrishnan, George Allen and Unwin Ltd, London, 1953, p 643.

[2] පච්චාසන්නමරණස්ස තස්ස වීථිචිත්තාවසානෙ භවඞගක්ඛයෙ වා චවනවසෙන පච්චුප්පන්න භවපරියොසානභූතං චුතිචිත්තං උප්පජ්ජිත්වා නිරුජ්ඣති, තස්මිං නිරුද්ධාවසානෙ තස්සානන්තරමෙව තථාගහිතං ආරම්මණං ආරබ්භ සවත්‍ථුකං අවත්‍ථුකමෙව වා යථාරහං අවිජ්ජානුසයපරික්ඛිත්තෙති තණ්හානුසයමූලකෙන සඞඛාරෙන ජනියමානං සම්පයුත්තෙහි පරිග්ගය්හමානං සහජාතානමධිට්ඨානභාවෙන පුබ්බඞගමභූතං භවන්තරපටිසන්ධිසඞඛාතං මානසං උප්පජ්ජමානමෙව පතිට්ඨාති භවන්තරෙ

අභිධර්මාර්ථ සංග්‍රහය, පි. 86.

[3] සං. නි. II, අස්සුතවත්‍ථු සුත්ත, පි. 148.

අනුව චුතියෙන් අනතුරුව එයට අනුරූපී වූ ප්‍රතිසන්ධි චිත්තයක් නිර්මාණය වන අයුරු දක්වා ඇත. අභිධර්ම සංග්‍රහයේ ද චුති චිත්තය, ප්‍රතිසන්ධි චිත්තය, භවංග චිත්තය යනු එකම චිත්තයක් ලෙස දක්වා තිබීමෙන් ඉහත ආකල්ප තහවුරු කොට ඇත.[4]

මෙම අන්තරාභවිකත්‍වය පිළිබඳ ප්‍රශ්න කිරීමක් හා උත්තර දීමක් කථාවත්ථුපකරණයෙන් දැකගත හැකි වේ. ඒ තුළින් මේ පිළිබඳ ථෙරවාදී ආකල්පය විෂයෙහි පිළිතුරක් සොයාගත හැකි වේ. එහි අන්තරාභවයක් ඇත්තේ දැයි සකවාදියා ඇසූ කළ ''එසේය'' පරවාදියා පිළිතුරු දෙයි. ''එය කාම භවය ද? රූප භවය ද? අරූප භවය දැයි ඇසූ විට ''නැතැයි'' උත්තර දෙයි. ''කාම භවයටත් රූප භවයටත් අතරෙහි හෝ රූප භවයටත් අරූප භවයටත් අතරෙහි හෝ අන්තරා භවයක් ඇද්දැයි'' විචාළ කල්හි ''නැතැයි'' උත්තර දෙයි. නැවත ඒ අන්තරාභව ගත්පසට වැඩි වූ සවැනි ගතියක් ද? එය විඥානස්ථිතියක් ද? සත්ත්වවාස භවයට වැඩි වූ දසවෙනි සත්ත්ව වාසයක් දැයි ඇසූ විට ''නැතැයි'' උත්තර දෙයි. ''අන්තරා භවයෙහි උපදවන කර්මයක් ඇද්දැයි සකවාදියා ඇසූ විට පරවාදියා ''නැතැයි'' උත්තර දෙයි. එහි උපන් සත්ත්වයෝ ජරාවට මරණයට හා නැවත ඉපදීමට පැමිණෙත්දැයි ඇසූ විට ''එසේ නොකිය යුතුයි'' උත්තර දෙයි. හැම සත්වයන්ටම අන්තරා භවයක් ඇත්දැයි විමසූ විට ''නැතැයි'' කියයි. ''ආනන්තර්ය කර්මයක් කළ පුද්ගලයාට අන්තරා භවයක් ඇද්දැයි විචාළ කල්හි ''නැතැයි'' උත්තර දෙයි. මින්පසු ''අන්තරාපරිනිබ්බායි'' (අතරේ දී පිරිනිවෙන) පුද්ගලයෙක් ඇත්තේ නොවේදැයි පරවාදියා අසයි. එසේයි යැයි සකවාදියා පිළිතුරු දුන්විට ''එබැවින් අන්තරා භවයක් ඇතැයි පරවාදියා කියයි.'' එසේ නම් උපහච්ච පරිනිබ්බායි අසංඛාරභව ආදියක් ඇද්දැයි සකවාදියා අසයි. එසේ නැතැයි පරවාදියා කී විට ''එසේ නම් අන්තරා භවයකුත් නැතැයි'' සකවාදියා නිශ්චයට පමණුවයි.[5]

උක්ත කථාවත්ථුවේ දැක්වෙන සංවාදය තුළින් ථෙරවාදීහු අන්තරාභවිකත්‍වය ප්‍රතික්ෂේප කරන අයුරු පැහැදිලිව ම දැකගත හැකි වේ.

මීට අමතරව අන්තරා භවය පිළිබඳ දැක්වෙන සඳහනක් උදාන අටුවාවේ දී හමු වේ. එය මෙසේ ය. ''යම් කෙනෙක් 'උභයමන්තරෙන' යන පදය ගෙන අන්තරාභවයක් කැමතිවෙත් ද, එය ඔවුන්ගේ වැරදි අවබෝධයකි. අන්තරා භවයක් ඇත යන්න අභිධර්මයේ දී ප්‍රතික්ෂේප කරන ලදී. මෙහි 'අන්තරා' යන වචනය අන්‍ය විකල්පයක් දැක්වීම සඳහා ය. එහි අර්ථය මෙසේය. එහෙයින් බාහිය ඔබ මෙහෙත් නොවේ. එහිත් (පරලොව) නොවේ. ඒ දෙක අතරෙත් නොවේ. තවද යම් කෙනෙක් ***'අන්තරා පරිනිබ්බායි සම්භවෙසි'*** යන පදයන්ගේ අර්ථය වරදවාගෙන අන්තරා භවයක් ඇතැයි කියත් ද ඔවුනට මෙසේ කිව යුතුය. යම් හෙයකින් අවිහ බ්‍රහ්මලෝකාදියෙහි ආයුෂයෙන් භාගයක් නොඉක්මවා අතරේදී රහත් මග අවබෝධ කිරීම නිසා ඇතැම් කෙනෙක් ක්ලේෂ පරිනිර්වාණයෙන් පිරිනිවන් ද ඔවුහු

---

[4] පටිසන්ධි භවංගං ච - තථා චවනමානසං
එකමෙව තථෙවෙක - විසයං චෙකජාතියං

අභිධම්මත්ත සංග්‍රහ

[5] බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, 2003, ථෙරවාද බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, පිටු. 251-252.

'අන්තරාපරිනිබ්බායි' නම් වෙති. අතර භවයකට පැමිණ පිරිනිවෙන්නාහු නොවෙයි. ***'භූතාවා සම්භවේසි වා'*** යන තැන යම් කෙනෙක් වූවාහු ද අනාගතයෙහි නොවන්නා වූ ද ඒ රහත්හු 'භූත' නම් වෙති. දුරු නොකළ භවසංයෝජන ඇති බැවින් පෘථග්ජනයෝත්, යට මාර්ගඵලලාභීහූත් ඉපදීම සොයත්' යන අර්ථයෙන් 'සම්භවේසි' නම් වෙති. යෝනි සතර අතරෙන් අණ්ඩජ, ජලාබුජ සත්වයෝ බිත්තරයේ කලවන් වස්නි කෝෂයන් නොබිඳෙන තුරු 'සම්භවේසී' නම් වෙති. එයින් හික්මුණාහු 'භූත' නම් වෙති. සංසේජද ඕපපාතිකයෝ ප්‍රථම චිත්තක්‍ෂණයේ දී සම්භවේසි නම් වෙති. දෙවෙනි චිත්තක්‍ෂණය පටන් " භූත" නම් වෙති. යම් ඉරියව්වකින් යුක්තව උපදිත්නම් සම්භවේසී නම් වෙති. ඉන්පසු 'භූත' නම් වෙති''[6]

මෙම විවරණයෙන් ද පෙනී යන්නේ ථෙරවාද සම්ප්‍රදාය තුළ අන්තරාභවික අවස්ථාවක් නොපිළිගන්නා බවයි. නමුත් අන්තරාභවිකත්‍වය පිළිබඳ පසුකාලීන විවරණයන්ට මූලබීජ සපයනුයේ ආදි බෞද්ධ ඉගැන්වීම්ය. මෙහි දී අධ්‍යයනයේ පහසුව සඳහා අන්තරාභවිකත්වය පිළිබඳ ආදි බෞද්ධ ඉගැන්වීම් කීපයක් දැක්වීම උචිත වේ.

මෙහිලා ම. නි. මහාතණ්හාසංඛය සූත්‍රයේ එන ඉගැන්වීම ඉතා වැදගත් වේ. එහි දී කලලයක් නිර්මාණය වීම සඳහා බලපානු ලබන සාධකයන් අතුරෙන් එක් ප්‍රධාන සාධකයක් ලෙස දැක්වෙන්නේ ''ගන්‍ධබ්බයෙකුගේ පැමිණීමයි''[7] ***(ගන්ධබ්බො ච පච්චුපට්ටිතො හොති)*** අන්තරාභවිකත්‍වය පිළිගන්නා වූ බොහෝ පිරිස් "ගන්‍ධබ්බ" අවස්ථා ලෙස පෙන්වා දීමට උත්සහ දරනු ලබන්නේ මෙ අන්තරාභවික තත්‍වය යි. නමුත් මේ අදහසට ථෙරවාදී සම්ප්‍රදාය එකඟ වන්නේ නැත. ඔවුන් ගන්‍ධබ්බ අවස්ථාව ලෙස විග්‍රහ කරනුයේ මරණාසන්න අවස්ථාවේ වූ චිත්ත විථියක් ලෙස ය. සාරත්‍ථදීපනී ටීකාවේ ගන්‍ධබ්බ අවස්ථාව මෙසේ විග්‍රහ වී ඇත. ''ගන්‍ධබ්බ නම් එහි (ඉපදීමට) එළඹෙන සත්වයා ය. "ගන්තබ්බ" යන්නේ "ත" කාරයට "ධ" කාර කොට මෙය සිද්ධ කරන ලද බව දැක්වේ. නැතහොත් ඉපදීම ලබන ගතියේ නිමිත්ත එළඹ සිටීමෙන් ප්‍රකාශ කරන බැවින් "ගන්‍ධ" යැයි නම් ලැබූ, භවගාමී කර්මයෙන් පවතින්නේ"ගන්‍ධබ්බ" නම් වේ. එහි උපදින සත්වයා යි.''[8]

මෙහි ''එළඹ සිටියේ ය'' යන්නේ තේරුම නම්, මවුපියන්ගේ එක්වීම බලාපොරොත්තු වෙමින් සමීපයේ සිටීම නොවේ. කර්ම යන්ත්‍රයෙහි පිහිටි යම්කිසි සත්වයෙකු එහි උපදිනා බැවින් හෙතෙම පෙර ජාතියේ සිටියේම වෙයි. ගතිනිමිත්තාදී අරමුණු ගැනීම වශයෙන් ඉපදීමට අභිමුඛව සිටීය යන අදහස මෙයින් වේ.

---

[6] එම. පිටු. 253-254.

[7] තිණ්ණං ඛො පන, භික්ඛවෙ, සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති හොති, ඉධ මාතාපිතරො ච සන්නිපතිතා හොන්ති, මාතා ච න උතුනී හොති, ගන්‍ධබ්බො ච න පච්චුපට්ඨිතො හොති, නෙව තාව ගබ්භස්සාවක්කන්ති හොති, ඉධ මාතාපිතරො ච සන්නිපතිතා හොන්ති, මාතා ච උතුනි හොති, ගන්‍ධබ්බො ච න පච්චුපට්ඨිතො හොති, නෙව තාව ගබ්භස්සාවක්කන්ති හොති, යතො ච ඛො, භික්ඛවේ, මාතාපිතරො ච සන්තිපතා හොන්ති, මාතා ච උතුනී හොති, ගන්‍ධබ්බො ච පච්චුපට්ඨිතො හොති එවං තිණ්ණං සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති හොති.

ම. නි. I, මහාතණ්හාසංඛය සුත්ත, බු. ජ. මු., පි. 602.

[8] බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, 2003, ථෙරවාද බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, පි. 250.

මෙසේ ද ථෙරවාදී ආචාර්යවරුන් අන්තරාභවය ප්‍රතික්ෂේප කරන අයුරු පෙනේ. ''එළඹ සිටීම'' නම් සමීපයෙහි ඇවිත් සිටීම නොවන අතර, පෙර ජාතියේ චුත නොවූ සත්වයා ගතිනිමිත්තාදී අරමුණු ගැනීම් වශයෙන් අභිමුඛව සිටීම මෙහි කියන ලදී.[9]

නමුත් දී. නි. මහානිදාන සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ හා ආනන්ද තෙරුන් අතර සිදුවන්නා වූ සංවාදය තුළ මෙයට වඩා වෙනස් වූ අර්ථයක් ඉස්මතු වන ආකාරය දැකගත හැකි වේ. එහි දී විඤ්ඤාණයක් මව් කුසට ඇතුල් වන්නේ නැතිනම් නාම-රූප ධර්මයන් මව් කුස තුළ එකට එකතු නොවන බවත්, යම් ලෙසකින් ඇතුල් වූ විඤ්ඤාණය යළි බැහැර වන්නේ නම් නාමරූප ධර්මයන්ගේ පැවැත්මක් හෙවත් වර්ධනයක් නොවන බවත් දක්වා ඇත.[10] මේ තුළ විඤ්ඤාණය යනු නාම-රූප කෙරේ ඇතිව නැවත බැහැර වීමට ද ඉඩ ඇති ධර්මතාවයක් බැවින් එහි දී චුතියක් සමඟම ප්‍රතිසන්ධිය සිද්ධවේය යන ථෙරවාද ආකල්පය හමුවේ යම් ගැටළුවක් නිර්මාණය වී ඇත.

නමුත් ථෙරවාද ආකල්පය වන්නේ සංසාරය යනු ස්කන්ධයන්ගේ නොසිඳෙන පරම්පරාවක් ලෙස පැවැත්මයි. එහෙයින් සසරෙහි යම් තාවකාලික හෝ නැවැත්මකට ථෙරවාදයේ ඉඩක් නොමැත.[11] මේ බව ම.නි. ආනෙඤ්ජසප්පාය සූත්‍රයෙහි දැක්වෙන ''සංවත්තනික විඤ්ඤාණ''[12] යන පදයෙන් ද දැකගත හැකි වේ. මෙහි දී ''සංවත්තනික විඤ්ඤාණය'' යනුවෙන් දක්වා ඇත්තේ භවයක් තවත් භවයක් හා ඈඳුණු ලබන විඤ්ඤාණය යි. පසුකාලයේ දී ආභිධම්මිකයන් ද ප්‍රතිසන්ධි විඤ්ඤාණය ලෙස යොදා ගන්නට ඇත්තේ ද මෙම මූලබීජය විය යුතුය. එසේම මෙලොව ද පිහිටි පරලොව ද පිහිටි අතර නොකැඩුනු විඤ්ඤාණයක් ගැන සම්පාසදනීය සූත්‍රයේ ද දැක්වේ. එය "අබ්භොච්ඡින්න විඤ්ඤාණය" ලෙස එහි විස්තර වේ.[13]

නමුත් සං.නි. වච්ඡගොත්ත සූත්‍රයේ මෙබඳු දේශනාවක් වේ. එහි දී වච්ඡගොත්ත බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසා ඇත. චුති - ප්‍රතිසන්ධි අතර කාලය තුළ සත්වයෙකුගේ ජීවිතයේ ස්වරූපය කෙසේ වන්නේ ද? එයට පිළිතුර ලෙස බුදුරජාණන් වහන්සේ දක්වා ඇත්තේ ''වච්ඡය, යම් කලෙක

---

9 එම. පි. 251.

10 ''විඤ්ඤාණං බො ආනන්ද මාතු කුච්ඡිං න ඔක්කමිස්සථ අපිනු බො නාමරූපං මාතු කුච්ඡිස්මිං සමුච්ඡිස්සථ''
''නොහෙතං භන්තෙ''
''නාමරූපං මාතු කුච්ඡිං ඔක්කමිත්වා වොක්කමිස්සථ අපි නු බො නාමරූපං ඉත්ථත්තාය අභිනිබ්බත්තිස්සථාති''
''නොහෙතං භන්තෙ''

දී. නි. මහානිදාන සුත්ත

11 අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බාකොටි න පඤ්ඤායති''

සං. නි. II, අස්සු සුත්ත, බු. ජ. මු., පි. 278.

12 ම. නි. III, ආනෙඤ්ජ සප්පාය සුත්ත, පි. 82.

13 විඤ්ඤාණ සොතං පජානාති උභයතො අබ්බොච්ඡින්නං ඉධලොකෙ පතිට්ඨිතඤ්ච පරලොකෙ පතිට්ඨිතඤ්ච.

දී. නි. III, සම්පසාදනීය සුත්ත, පි. 16.

සත්වයෙකු මේ කයත් අත් හරී ද? සත්වයා වෙනත් කයකට නොගියේ වෙත් ද? මම ඔහු තණ්හා උපාදානය කොට ඇත්තෙක් කොට කියමි.[14] වච්ඡය, තණ්හාවෙන් යුක්ත වූවහුට ඒ අවස්ථාවෙහි උපාදානය වෙයි'' යනුවෙනි. මේ තුළින් ද චුති - ප්‍රතිසන්ධි අතර කාලය තුළ යම් පැවැත්මක් අවධාරණය වෙතැයි අන්තරාභවය පිළිගත්තහු තර්ක කොට ඇත. මේ හා සමාන වූ දේශනාවක් උදාන පාලියේ බාහිය සූත්‍රයේ ද දැකගත හැකි වේ.

***''තතො ත්‍වං බාහිය නෙවිධ නහුරං න උභය මන්තරෙ එසෙවන්තො දුක්ඛස්සාති''***

මෙහි දැක්වෙන ''උභයමන්තරෙ'' යන්නෙන් අදහස් කොට ඇත්තේ මෙලොවත් නොව පරලොවත් නොව මේ දෙක අතර ඇත්තා වූ අවස්ථාවකි. එය ''අන්තරාභවය'' ලෙස අන්තරාභවිකයහු දක්වති. ථෙරවාදී සම්ප්‍රදාය අන්තරාභවිකත්‍වය පිළිනොගත්ත ද පසුකාලීන අටුවා ග්‍රන්ථයන් තුළ අන්තර්ගත කරුණු විමර්ශනය කිරීමේ දී එම අවස්ථාව ථෙරවාදීහු ද නොදැනුවත්ව හෝ යම් අයුරකින් පිළිගෙන ඇතැයි සිතිය හැකිය. විමතිවිනොදනි ටීකාචාරීන් වහන්සේගේ ගන්‍ධබ්බයා සම්බන්‍ධ විග්‍රහයෙන් ද මේ බව දැකගත හැකි වේ.[15] එහි දී උන්වහන්සේ දක්වන ***''ගන්‍ධබ්බොති තත්‍රූපගො සත්තො අධිප්පෙතො''*** යන්නෙන් අදහස් කොට ඇත්තේ ගන්‍ධබ්බයා නම් එළඹ සිටි සත්ත්වයා යන්න යි. එසේම ***''ගන්තබ්බොති වුත්තං හොති''*** යන්නෙන් දක්වා ඇත්තේ ''යා යුත්තා කියන ලද්දේ වේ'' යන්න යි. මෙහි දී ගන්‍ධබ්බයා නළුවෙකුට උපමා කිරීමෙන් දක්වා ඇත්තේ නළුවෙක් විවිධ වෙස් ගන්නා සේ ගන්ධබ්බයා විවිධ වූ ආත්මභාව ධරණ බව යි. මෙසේ ඇතැම් අටුවා තුළ අන්තරාභවය පිළිබඳ යම් යම් පිළිගැනීම් මාත්‍රයන් පැවතිය ද, සම්ප්‍රදායයක් ලෙස ථෙරවාදීහු මෙම සංකල්පය බැහැර කරන්නා වූ සම්ප්‍රදායක් ලෙස දැක්විය හැකිය.

"ප්‍රතිසන්ධි චිත්තය" ලෙස දැක්වෙන්නේ භවයක් තුළ හටගත්තා වූ පළමු චිත්තය යි. ථෙරවාදී ආකල්පයන්ට අනුව මෙය චිත්ත වීථියක් තුළ නිර්මාණය වන්නකි. එනම් සත්‍වයාගේ පෙර භවයේ අවසාන චිත්ත පරම්පරාව වන චුති චිත්ත වීථියේ කොටසක් ලෙස ප්‍රතිසන්ධි චිත්තය නිර්මාණය වේ. මේ අනුව ථෙරවාදීන් දක්වන්නේ පෙර භවයේ සිතුවිලි පරම්පරාව ප්‍රතිසන්ධි චිත්තයත් සමඟ මතු භවය හා නොකැඩී සම්බන්‍ධ වන බවයි. පෙර භවයේ චුති චිත්තයේ සිතුවිලි පරම්පරාව මතු භවයේ ප්‍රතිසන්ධි චිත්තයෙන් අවසන් වූ විට මතු භවයේ පළමු චිත්තය ලෙස මෙම ප්‍රතිසන්ධි චිත්තය සළකනු ලබයි.[16]

---

[14] යස්මිං ච වච්ඡ සමයෙ ඉමං ච කායං නික්ඛිපති. සත්තො ච අඤ්ඤතරං කායං අනුප්පන්නො හොති. තමහං තණ්හූපාදානං වදාමි. තණ්හා සමඩිගිස්ස වච්ඡ. තස්මිං උපාදානං හොති.

සං. නි., වච්ඡගොත්ත සුත්ත, බු. ජ. මු., පි. 288.

[15] ගන්‍ධබ්බොති තත්‍රූපගො සත්තො අධිපත්තො ගන්තබ්බොති වුත්තං හොති. අථවා ගන්‍ධබ්බො නාම. රඞ්ගනටො විය තත්‍රභවෙසු නානා වෙස්සග්ගහණතො අයම්පි ගන්‍ධබ්බොති වුත්තො.

විමති විනෝදනී ටීකා. Chatta Sangayana CD Rom, Vipassana Research Institute Dhammagiri, Igatpuri,422 - 403 Disk, Nashik, India

[16] තස්මිං නිරුධාවසානෙ තස්සානන්තරමේව තථා ගහිතං ආරම්මණං අරම්භ භවන්තර පටිසන්ධාන වසෙන පටිසන්ධි සංඛාතං මානසං උප්පජ්ජමානමෙව පතිට්ඨාති භවන්තරෙ.

එසේම ඉන් අනතුරුව එම ප්‍රතිසන්ධි චිත්තයට අනුරූප වූ වෙනත් චිත්ත පරම්පරාවක ආරම්භය සිද්ධ වේ.

ම.නි. මහා තණ්හාසංඛය සූත්‍රයේ දැක්වෙන කලලයක් නිර්මාණය වීම සඳහා පදනම් වන්නා වූ කාරණා ථෙරවාදී සම්ප්‍රදාය තුළ ද පිළිගැනීමට ලක්ව ඇත.[17] ඒ අනුව එහි විග්‍රහ වන්නා වූ ***''ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො හොති''*** යන්නෙහි දැක්වෙන ගන්ධබ්බයෙකුගේ පැමිණීම යන්න ථෙරවාදීන් විග්‍රහ කරනු ලබන්නේ මෙම ප්‍රතිසන්ධි චිත්තයාගේ බලපෑම යි. ඒ අනුව ප්‍රතිසන්ධි චිත්තයාගේ ආරම්භය පෙර භවයේ සිදුවුව ද එහි අවසානය සිදුවන්නේ මතු භවයේ කලලයක් නිර්මාණය වීම සඳහා උපයුක්ත අනෙකුත් ධර්මතාවන් හා එක්වීමෙන් බව නිගමනය කළ යුතු වේ. නමුත් ආදි බෞද්ධ ඉගැන්වීම්වලට අනුව, මව් කුසක ප්‍රතිසන්ධිය නිර්මාණය වී, එය නැවත කුසෙන් බැහැර වන්නේ නම්, නැවත එම ප්‍රතිසන්ධි විඥානය ගමන් කරන්නේ ද යන්න ථෙරවාදයේ විග්‍රහ  වී ඇති ආකාරයක් දක්නට නොලැබේ.

මීට අමතරව කර්මයේ ප්‍රභේද දක්වන තැන චතුර්විධ කර්ම[18] අතුරෙන් ආසන්න කර්ම චේතනාව අනුව ප්‍රතිසන්ධිය සිදුවන ආකාරය දක්වා ඇත. මෙහි දී කර්ම හෙවත් මරණාසන්න අවස්ථාවේ දී කළ කර්මය හා ඊට උපයෝගී කොටගත් උපකරණ ආදී කර්ම නිමිත්ත හා මතු ඉපදිය හැකි ස්ථානය ඇඟවෙන ගති නිමිත්ත යන කරුණු තුනෙන් එකක් ආශ්‍රය කොට ගෙන ඊළඟ භවයේ ප්‍රතිසන්ධියට අදාළ චිත්තය සකස් වන බව දැක්වේ. උප්පත්තියක් සඳහා අදාළ වන කම්ම, චිත්ත, උතු හා ආහාර යන කරුණු හතරක් ද ඇත. මේවායේ දායකත්වය පැහැදිලි කිරීමට ථෙරවාද අටුවාචාරීන් වහන්සේලා සන්සන්දනයක් සිදුකොට ඇත. ඒ අනුව අවිජ්ජා, තණ්හා, උපාදාන යන කරුණු තුන උපදින දරුවාගේ මව මෙන් ද, කර්මය පියා මෙන් ද, ආහාර කිරි මව මෙන් ද දායක වන්නේ යැයි පවසයි.[19] ප්‍රතිසන්ධි සිතේ ආරම්භයත් සමඟම කර්මජ රූප ඉපදීම ඇරඹෙයි. ඒ අනුව උපදින සත්ත්වයාගේ හැඩරුව, ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය ඇතුලු සමස්තය නිර්මාණය වන්නේ කර්ම බලයෙනි. පිළිසිඳ ගත් සිත භවංගය වූ තැන් පටන් චිත්තජ හා උතුජ රූපත්, මව ගන්නා ආහාරවල සාරයත් දරුවාට ලැබීමත් සමඟ ආහාරජ රූප උපදින්නට පටන් ගනී. ***''විඤ්ඤාණ පච්චයා නාමරූපං''*** යයි කී තැන "නාම" යැයි අදහස් කොට ඇත්තේ මවුකුසේ පිළිසිඳ ගන්නා සත්ත්වයාගේ සිතයි. එනම් ප්‍රතිසන්ධි චිත්තය යි. පිළිසිඳ ගැනීමත් සමඟ සත්ත්වයා මව්කුස තුළ වර්ධනය වන්නේ පඤ්චස්කන්ධයක් ලෙසටය. එයින් වේදනා, සංඥා හා සංඛාර යන ස්කන්ධ තුන ''නාම'' යනුවෙන් දක්වා ඇත. පඨවි ආදී මහා භූත රූපත් ඒ ආශ්‍රිත උපාදාන රූපත් මෙහි "

---

උදාන පාලි අට්ඨකතා, බාහිය සුත්ත. Chatta Sangayana CD Rom, Vipassana Research Institute Dhammagiri, Igatpuri,422 - 403 Disk, Nashik, India

17 තිණ්නං ඛො පන භික්ඛවෙ - සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති හොති ඉධ මාතා පිතරො ච සන්නිපාතිතා හොන්ති - මාතා ච උතුනි හොති ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො හොති.

ම. නි. I, මහාතණ්හාසංඛය සූත්‍රය

18 චතුබ්බිධං කම්මං - යග්ගරුකං යබ්බහුලං
යදාසන්නං කටත්තා - වා පන කම්මන්ති

19 විසුද්ධි මග්ග, කඞ්ඛාවිතරණ විසුද්ධි නිද්දේසය.

රූප" නමින් ගැනේ. මේවා උපද්දවන්ට මුල් වන්නේ විඤ්ඤාණය යි. මෙසේ ප්‍රතිසන්ධි සිතක් යනු විපාක සිතක් ලෙස දැක්විය හැක. මේ විපාක සිත පහළ වනවිට ඒ සමග චෛතසික ධර්මයෝ පනස් දෙක අතරින් ඉහත කී තුන ඇති වේ. මෙම චෛතසික අඩංගු වන්නේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය තුළ ය.

මීට අමතරව ප්‍රතිසන්ධි චිත්තයේ සංයුතිය අනුව කලල රූපය සකස් වෙයි. එම සංයුතිය තුළ කාය දසක, භාව දසක හා වත්ථු දසක යනුවෙන් රූප කලාප හෙවත් ගොනු තුනක් ඇත. කායදසක කලාපයේ පඨවි, ආපො, තෙජො, වායො, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිත කාය යන කොටස් දහය ඇතුළත් ය. භාව දසක හා වත්ථු දසකවල අවසාන එක පිළිවෙළින් ස්ත්‍රී පුරුෂ භාවය හා හදය වත්ථුව බව දැක්වෙයි. ඒ අනුව කලල රූපයක් යනු මෙසේ රූප කොටස් තිහක සංයුතියක් බව පෙනී යයි. මේ සියල්ලට පදනම ලෙස සැළකිය හැක්කේ ප්‍රතිසන්ධි චිත්තයාගේ ඇති සංයුතිය යි.